## කඩුවෙල මහා නගර සභාව
## කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 26 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31දින ද සභාවට යවා ඇත.

1.2 අහිතකර මතය

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම
-------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (i) සභාව සතු අංක 196100163869561 දරන මහජන බැංකු ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු.847,368 ක් වූ ශේෂය ගිණුම්වලට ගෙන නොතිබුණි. | සියළුම ගිණුම්ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතුකල යුතුවේ. | සභාව සතු 196100163869561 ගිණුමේ ශේෂය ජංගම වත්කම් තුළ අන්තර්ගත වේ. එය ශේෂ පත්‍රයේ සටහන් අංක 08 තුල අන්තර්ගත වී ඇත |
| (ii) 2018 දෙසැම්බර් 05 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ණය පදනම මත ලබාදුන් වටිනාකම රු.10,779,000 ක් වූ ට්‍රැක්ටර් රථ 06 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන වෙන්කල යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2019 වර්ෂයේ JE 03 මඟින් නිවැරදි කර ඇත |
| (iii) දිළිඳු දරුවන් සඳහා පාවහන් ලබාදීම වෙනුවෙන් රු.3,500,000 ක් වැරදි ලෙස ණයහිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණි. | ණයහිමි ගිණුම නිවැරදිකර දැක්විය යුතුවේ. | එම ශේෂය කපා හැරීම සඳහා 2019. 07. 20 දිනට යෙදෙන මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරමි. |
| (iv) ගිවිසුම් කාලය ඉක්ම වූ ඉටුනොකරන ලද කර්මාන්ත 06 ක් සඳහා රු.8,241,437 ක් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | ගිණුම නිවැරදිකල යුතුවේ. | සභා තීරණය පරිදි කපාහැරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (v) වත්කම් සමීක්ෂණයකින් හෝ භෞතික සත්‍යාපනයකින් සනාථකර නොගත් වටිනාකම රු.7,434,607ක් වූ වසර 20 ක් පැරණි ස්ථාවර වත්කම් ශේෂයක් ගිණුම්වල ඇතුලත්කර තිබුණි. | මෙම ස්ථාවර වත්කම් හඳුනාගත යුතුවේ. | මින් ඉදිරියට, එසේ නොවීම පිණිස භාණ්ඩ හඳුනා ගැනීමේ කේත ක්‍රමයක් ආරම්භ කර ඇත. |

| | | |
|---|---|---|
| (vi) 2018 වර්ෂයේදී රු.108,740 කට,වෙන්දේසි කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වලින් ඉවත් කළයුතුවේ. | මින් ඉදිරියට, එසේ නොවීම පිණිස භාණ්ඩ හඳුනා ගැනීමේ කේත ක්‍රමයක් ආරම්භ කර ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. |
| (vii) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාවහන් ලබා ගැනීම සඳහා බෙදාදීමට මිලදී ගත් රු.1,000 බැගින් වූ වවුචර්පත් 2,800ක වට්ටම් අඩුකළ පසු වටිනාකම වන රු.2,380,000 ක් සභාවේ තොගයෙන් අඩු නොකිරීම නිසා ගිණුම්වල තොග වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | තොගයෙන් අඩුකර ගිණුම්වල පෙන්විය යුතුවේ. | ඒ සඳහා 2018. 12. 31 වන දින භාණ්ඩ ලැබීම් අංක 2625 මඟින් භාණ්ඩ ලැබීම් පත්‍රයක් නිකුත් කර ලේඛනගත කර ඇත. නිකුත් කිරීමේ නියෝග අංක 05 මඟින් 2019. 01. 10 වන දින පොදු උපයෝගීතා හා සුබ සාධන දෙපාර්තමේන්තුවට නිකුත් කර ඇත. |
| (viii)2016 හා 2017 වර්ෂවලට අදාලව 2018 වර්ෂයේදී ලද මුද්දර ගාස්තු රු.220,439,262ක් ණයගැති ශේෂයෙන් අඩුකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | ආදායම් ලැබීම් ලෙස පෙන්වා ඇති අතර, එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

------------------------

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| විස්තරය | වෙනස රු. | | |
| (i) ලී බඩු හා සවිකිරීම් | 48,360 | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වෙනස 1997 වර්ෂයටත් කළින් සිට පැවත එන වෙනසක් වේ. ප්‍රමාණවත් ලේඛන නොපවතින අතර, නිරවුල් කිරීමට නොහැකිව ඇත. |
| (ii) ආයුර්වේද ඖෂධ තොග | 218,580 | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙනස 2012 වසරේ හෝ ඊට පෙර සිට පැවත එන්නකි. නිරවුල් කිරීමට ප්‍රමාණවත් ලේඛන නොපවතී |
| (iii) මහජන බැංකුවේ මුදල් ගිණුම 196100170010082 196100260010082 | 18,016,006 | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම අගය 2011 වර්ෂයට හෝ ඊට පෙර සිට පැවත එන වෙනසක් වේ. මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් විමර්ශනයක් සිදුකළ අතර, එම වාර්තාව අප වෙත ලැබුණු පසු ඒ අනුව, නිවැරදි කිරීම් කිරීමට බලාපොරොත්තු වෙමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

---

තොරතුරු ඉදිරිපත් නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.69,729,443ක් වූ ගිණුම් විෂයයන් 07කට අදාලව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය / සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී |

1.4 අනුකූල නොවීම.

---

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) මහා නගර සභා ආඥා පනත 254 (අ) (2) වැනි වගන්තිය | සභාවට අයවිය යුතුව තිබෙන සියළු මුදල් අයකර ගෙන සභාවේ අරමුදලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආදායම් විෂයයන් 6 ක රු.61,430,162 ක් වූ හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | (i) වරිපනම් - රු.46,913,825<br>වරිපනම් බදු අයකර ගැනීමට විශේෂ වැඩ පිළිවෙලක් මේ වන විට ආරම්භ කර ඇත.<br>(ii) කර්මාන්ත බදු - රු.57,103<br>බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලයෙහි පමණක් මෙම හිඟය ඇති වී තිබේ. සොයා බලා ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.<br>(iii) නිවාස කුලී රු.117,546<br>බත්තරමුල් ටී.සී. නිවාස කුලී මුදල් වේ.<br>(iv) පොළ බදු රු.368,123<br>මෙම හිඟ මුදල 2012 වර්ෂයේ සිට පවතින අතර ගිනුම් කාරක සභා නියෝගය මත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වනු ලබයි.<br>(v) වෙළඳ සංකීර්ණ කුලී රු.2,263,526<br>මෙම මුදල් අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.<br>(vi) විනෝද බදු - රු.11,710,039<br>මෙම මුදල් අයකර ගැනිමට නීතිමය පියවර ගෙන ඇති අතර මේ වන විට හිඟයෙන් කොටසක් අයකරගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ 371 (5) | දිගින් දිගටම පැවත එන රු.193,544ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂයක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | රු.193,544ක මුදල මෙතෙක් හඳුනා ගැනීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේ දී හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) මු.රෙ 571 | වර්ෂ 03 ඉක්මවූ රු.171,272 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) මු.රෙ 1642 | 2018 වර්ෂය තුලදී සිදුවී ඇති වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අභ්‍යන්තර පරික්ෂණ සඳහා පොලිස් පැමිනිලි සටහන් කරන මෙන් රියදුරන් දැනුවත් කර ඇත. |
| (ඇ) චක්‍රලේඛ හා ලිපි | | | |
| (i) 2015 ජුලි 14 දිනැති 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.100,000ක උපරිම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දී තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | විගණන විමසුම ලැබීමෙන් පසු රු.100,000ක අත්තිකාරම් මුදලක් පමණක් ලබා ගැනීමට කටයුතු කළ අතර, එම මුදලින් දැනට දුරකථන දීමනා ගෙවීම සිදුකරන බව දන්වමි. |
| (ii) 2013 ජුනි 18 දිනැති අංක WP/LGD/01/2013 දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | සැලසුම් කමිටුවට සහභාගීවීම වෙනුවෙන් නිලධාරීන් සිව්දෙනෙකු වෙත චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.315,000 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරමින් හිටපු නාගරික කොමසාරිස් විසින් නියෝගයක් ලබා දී නීති නිලධාරිනිය සැලසුම් කමිටු සාමාජිකත්වයට පත් වී තිබු අතර හිටපු නගරාධිපති ජී.එච්. බුද්ධදාස මහතා විසින් වැඩ අධිකාරී මහතාටද සැලසුම් කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට අනුමැතිය ලබා දී ඇත. |
| (iii) 1985 මාර්තු 20 දිනැති නා.සං.අ චක්‍රලේඛ අංක දෙසැ/1 | අනවසර ඉදිකිරීම් සඳහා අයකරන ගාස්තුවෙන් සියයට 25ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත නොයවා එම මුදල තැන්පත් ගිණුමට බැර කරගෙන තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අනවසර ඉදිකිරිම් සඳහා ලබාගන්නා මුදලින් 25% ක ප්‍රමාණය නාගරික සංවර්ධන අධිකාරිය නමින් පවත්වාගෙන යනු ලබන ගිණුමක තැන්පත් කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| (iv) 1993 නොවැම්බර් 18 දින නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | පළාත් පාලන ආයතන මගින් අයකරනු ලැබූ රු.2,236,935ක සේවා ගාස්තු නාගරික සංවර්ධනය වෙනුවෙන් බැංකු ගිණුමක තැන්පත් කර හඳුනාගත් ව්‍යාපෘතීන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | මෙම මුදල යොදවා බඳුවත්ත ස්වයං රැකියා මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම හා තපෝවනය කෙලවර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සහ ශක්‍යතා වාර්තා ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.948,904,276 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.799,722,412 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මහජන බැංකුවේ අංක 196-1 -001-6-3869561 දරන ජංගම ගිණුම දීර්ඝ කාලයක සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණු අතර 2008 වර්ෂයේ සිට පවතින උපලබ්ධි නොවූ ලැබීම් රු.528,488ක් හා හඳුනා නොගත් ගෙවීම් රු.295,596ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | ශේෂය නිවැරදි කිරීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | ගිණුම් කාරක සභාවේ දී ලබාදුන් නියෝගය අනුව ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරමි. |

2.3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 146,788,000 | 155,465,905 | 146,201,350 | 58,680,968 | 140,753,000 | 147,813,564 | 137,989,729 | 60,432,578 |
| (ii) කුලී | 21,980,505 | 19,511,569 | 17,753,272 | 2,749,197 | 20,337,325 | 19,323,989 | 16,970,407 | 2,808,403 |
| (iii)බලපත්‍ර ගාස්තු | 15,720,000 | 16,891,953 | 16,841,953 | - | 15,300,000 | 13,749,903 | 14,049,515 | - |
| (iv)වෙනත් ආදායම් | 705,689,700 | 1,066,603,602 | 464,861,872 | - | 602,263,436 | 602,263,436 | 263,809,151 | 338,454,285 |
| එකතුව | 890,178,205 | 1,258,473,029 | 645,658,447 | 61,430,165 | 778,653,761 | 783,150,892 | 432,818,802 | 401,695,266 |

## 2.3.2 වරිපනම් හා බදු

**විගණන නිරීක්ෂණය**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්යාලය | අවු. 10ට වැඩි | අවු 5-10 අතර | අවු 3-5 අතර | අවු 1-3 අතර | එකතුව |
|---|---|---|---|---|---|
| | රු | රු. | රු. | රු. | රු. |
| කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලය | 3,527,084 | 5,551,596 | 1,987,524 | 4,822,738 | 15,888,942 |
| බත්තරමුල්ල කාර්යාලය | 1,193,436 | 1,316,087 | 1,180,631 | 5,602,163 | 9,292,317 |
| අතුරුගිරිය කාර්යාලය | - | 4,786,845 | 2,126,687 | 9,147,691 | 16,061,223 |
| එකතුව | 4,720,520 | 11,654,528 | 5,294,842 | 19,572,592 | 41,242,482 |

**නිර්දේශය**

හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ.

**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම.**

හිඟ ආදායම් අය කිරීමේ කටයුතු ඉටු කිරීමට පියවර ගනිමි. අයකරගැනීමට අපහසු අයගේ දේපල තහනම් කිරීමට කටයුතු කරමි.

2.3.3 කුලී

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) මාස 03 ක් ඉක්ම වූ හිඟ රු.142,281 කට අදාල කඩ කාමර 14ක් මුද්‍රා තබා තිබූ නමුත් මෙම කඩ කාමර නැවත බදු දීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලය ඉදිරියේදී මෙම පළමු මහළ වෙත ගෙන ඒමට කටයුතු සූදානම් කර ඇත. |
| (ආ) හිඟ කඩ කුලිය රු.33,362 ක් වූ බත්තරමුල්ල අංක 20 දරන කඩ කාමරය මුද්‍රා තබා වසර 05 කට අධික කාලයක් ගත වී ඇතත්, නැවත විවෘත කිරීමට පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | නව තක්සේරුව ලැබීමෙන් පසු කඩුවෙල හා බත්තරමුල්ල තක්සේරු වාර්තාව ලද වහාම ටෙන්ඩර් කිරීමේ කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) කඩුවෙල පොදු වෙළඳ පොළ කඩ කාමර කුලිය 2001 වර්ෂයේ තක්සේරුව අනුව ප්‍රවර්ථන වර්ෂයටද අයකර තිබුණි. 1984 වර්ෂයෙන් පසුව මේ වනතෙක් නව ගිවිසුම් වලට එළඹ නොතිබුණි. 2018 ඔක්තෝබර් 04 දිනැති සභා සම්මුතියකින් මෙම කඩ කාමර පවත්වා ගෙන යා හැකි ලෙස ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ඉටුකළ යුතු බව තීරණය කර ඇතත් මෙතෙක් එය ඉටු වී නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | මුදල් කමිටුවකදී සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කර ගැනීමට කටයුතු කිරීමෙන් පසු අළුත්වැඩියා කටයුතු සිදු කරමි. |

2.3.4 වෙනත් ආදායම්

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) විනෝද බදු<br>--------------<br>අවුරුදු 05 ට වැඩි රු.8,665,254 ක් වූ හිඟ විනෝද බදු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | පැවති හිඟය අනුව අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. |
| (ආ) සතිපොළ බදු<br>-----------------<br>වසර 05 කට වැඩි කඩුවෙල සතිපොලෙන් අයවිය යුතු රු.368,126ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරනු ලැබේ. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනවන විට සභාවට ලැබිය යුතු වරෙන්තු ගාස්තු හා දඩ වට්නාකම රු.23,825,852 ක් වූ අතර ඉන් රු.12,993,592 ක් වසර 05 කට වැඩි විය. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | වරිපනම් හිඟ අයකර ගැනීමේ දී මෙම ශේෂය අවම කර ගැනීමට කටයුතු කරමි. |

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| පළාත් සභාවෙන් 2018 දෙසැම්බර් 31 දින වනවිට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.12,993,750 ක් හා මුද්දර ගාස්තු රු.1,192,891,690 ක් විය. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලද 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු උපලේඛන පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇතත් කොළඹ හා හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් මුද්දර ගාස්තු උපලේඛන සකස් කර ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැත. |

2.3.6 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමට 2017 දෙසැම්බර් 22 දිනැති අංක 2051 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබුණද කඩුවෙල දිස්ත්‍රික් කාර්යාල බලප්‍රදේශයෙන් එකී බදු අයකර නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | ක්ෂේත්‍ර රාජකාරීවල යෙදෙමින් සංවර්ධනය නොකළ ඉඩම් පිළිබඳව පරීක්ෂා කර ඒවා හඳුනාගෙන වාර්තා කරන ලෙස ආදායම් පරීක්ෂක නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත. 2019 වර්ෂයේ දී එම මුදල් අය කිරීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වනවගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාරව අතිරේක ආදායම් උපයා ගැනීමට අතුරු ව්‍යවස්ථා සම්පාදනය නොකර ආදායම් මාර්ග 05 ක් සම්බන්ධයෙන් රු.13,187,842ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී උපයාගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරගත යුතුවේ. | ආදාහනාගාර / භූමදාන ස්ථාන වෙන්කිරීමේ ගාස්තු සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කර අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. ඉතිරි ආදායම් මාර්ග 04 සඳහාද දැනට අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කරමින් පවතී. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල කඩුවෙල, බත්තරමුල්ල හා අතුරුගිරිය උපකාර්යාලවල සැලසුම් කළ කර්මාන්ත 518 කින් කර්මාන්ත 20 ක් අත්හැර දමා තිබූ අතර ඊට හේතු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | සැලසුම්කල ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළයුතුවේ. | ගිවිසුම් කාලය ඉක්මවා ඇති නමුත්, වැඩ ආරම්භ නොකළ කඩුවෙල, බත්තරමුල්ල සහ අතුරුගිරිය උප කාර්යාලවලට අයත් කර්මාන්ත 31 ක් අවලංගු කර ශේෂ කපා හැරීම සඳහා 2019. 06. 04 දින පැවති මහා සභාවේ තීරණ අංක 02/මු/1054 මගින් තීරණය කර ඇත. |

(ඇ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කළ යුතුව තිබූ ඇස්තමේන්තු පිරිවැය රු.24,111,931 ක් වූ කර්මාන්ත 30ක් ආරම්භ කර නොතිබුණි. | ඉදිකිරීම් කර්මාන්ත සැලසුම්කල ආකාරයට අප්‍රමාදව අවසන්කල යුතුවේ. | ගිවිසුම් කාලය ඉක්මවා ඇති නමුත්, වැඩ ආරම්භ නොකළ කඩුවෙල, බත්තරමුල්ල සහ අතුරුගිරිය උප කාර්යාලවලට අයත් කර්මාන්ත 31 ක් අවලංගු කර ශේෂ කපා හැරීම සඳහා 2019. 06. 04 දින පැවති මහා සභාවේ තීරණ අංක 02/මු/1054 මගින් තීරණය කර ඇත. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| මහා නගර සභා බලප්‍රදේශයේ ජනිතවන කසළ, සභාවේ සේවකයන් සහ වාහන යොදාගෙන සභාව විසින් එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.175,735,196 ක වියදම් දරා තිබූ අතර එලෙස එකතු කරන කසළ බැහැර කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත් ආයතන 04 කට සමාලෝචිත වර්ෂය තුලදී රු.40,686,139 ක් ගෙවා තිබුණි. මීට අමතරව ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.53,320,390ක් ගෙවා තිබුණි. ඒ අනුව කසළ බැහැර කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකල මුළු මුදල රු.269,741,725 ක් විය. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) මහා නගර සභා ආඥා පනතේ 130 වගන්තිය අනුව එකතු කරනු ලබන සියළුම කසළ සභාවේ දේපළක් වියයුතු වුවද සභා ආදායමෙන් සියයට 6.3 ක් කසළ බැහැර කිරීම සඳහා වැයකර තිබුණි. | කසල වලින් ආදායම් ඉපැයීමට කටයුතු කළයුතු වේ. | කසළ බැහැර කිරීමේ සේවාව සඳහා සෙවන් ස්ටාර් සුපර් සර්විස් ආයතනය විසින් 2018. 07. 04 වන දින සිට ටිපර් රථ ලෝඩ් 01 කට රු.18,000කට ගිවිසුම් අත්සන් කර සේවාව සපයන ලදී. |

| | | |
|---|---|---|
| (ii) මහා නගර සභා ආඥා පනතේ 228 වගන්තිය ප්‍රකාර තෝරාගත් කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. | | 2018. 09. 18 වන දින ගිවිසුමේ කොන්දේසි කඩකිරීම හේතුවෙන් සෙවන් ස්ටාර් සුපර් සර්විස් ආයතනය කසළ බැහැර කිරීමේ සේවාවෙන් ඉවත් කරන ලදී.<br>දෙවන මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය වන G.F.C. මැෂිනරි (පුද්) සමාගම හා උනන්දුවන පාර්ශවයන් කැමැත්ත ප්‍රකාශ කර තිබුණි. ඔවුන් සමග එලඹීමට සකස් කරන ලද ගිවිසුමද ඉහත පරිදි වේ. |
| (iii) මහා නගර සභා ආඥා පනතේ 229 (1) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබා ගත යුතු ඇප ලබාගෙන නොතිබුණි. | කසල බැහැර කිරීම විධිමත් අධීක්ෂණයකට ලක් කළයුතු වේ. | මහා සභා තීරණයකට අනුව නැවත ටෙන්ඩර් කැඳවන තාක් තෝරාගත් පාර්ශවයන් වන බැවින්, මේ දක්වා ඇප තැන්පත් ලබා ගැනීමක් සිදු කර නොතිබුණි. |
| (iv) මහා නගර සභා ආඥා පනතේ 131 වගන්තිය ප්‍රකාරව පරිසරයට, ජනතාවට හා වනසතුන්ට පීඩාවක් නොවන පරිදි කසළ බැහැර කිරීමට සභාව විසින් විධිවිධාන සැලසිය යුතු බව දක්වා තිබුණද කසළ බැහැර කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් විධිමත් ලෙස කසළ බැහැර කරන්නේද සහ කුමන ප්‍රදේශයකට බැහැර කරන්නේද යන කරුණු සභාව විසින් සොයා බලා නොතිබුණි. | | පිළිතුරු ලබා දී නැත. |
| (v) සභා බලප්‍රදේශයේ කසළ කළමනාකරණය සඳහා, ප්‍රමාණවත් වාහන හා සේවක සම්පත් සභාව සතුව තිබියදී, මෙම කර්තව්‍ය සභාවට වඩා වාසිදායකව ඉටුකර ගැනීම සඳහා අනාගත සැලසුම් හෝ අධ්‍යනයක් සිදුකර නොතිබුණු අතර අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප) විසින් ඉදිරිපත්කල “කොම්පොස්ට් අංගනය ප්‍රතිසංවිධානය කිරීමේ සැලැස්ම - 2018” මේ වනතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනය ප්‍රතිසංවිධානය කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කළයුතුවේ. | 2019 කඩුවෙල මහා නගර සභාවේ ක්‍රියාත්මක සැලැස්ම පස් අවුරුදු සැලැස්ම හා සමගාමීව සකස් කර ඇත.<br>දිනකට දිරන කසළ ටොන් 10 ක් ආවරණය වන පරිදි බයෝගෑස් ව්‍යාපෘතියක් සකස් කර ඇත. එහි වැඩ අවසන් කර ඇත.<br><br>කොම්පෝස්ට් හලන යන්ත්‍රය වරින් වර අක්‍රීයවීමත්, එකවරකට ඇතුළු කළ හැකි පොහොර ප්‍රමාණය සීමාවීම හේතුවෙන් මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීම ප්‍රමාද වී ඇත. නව කොම්පෝස්ට් පොහොර හලන යන්ත්‍රය මිල දී ගැනීමෙන් අනතුරුව "කොම්පෝස්ට් අංගනය ප්‍රතිසංවිධානය කිරීමේ සැලැස්ම - 2018" ක්‍රියාවට නැංවිය හැකි වේ. |

(ඉ) පාරිසරික ගැටළු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| කැළණි ගඟ ආශ්‍රිතව ඇති ඇල මාර්ග හරස් කරමින් වැලි නිස්සාරණය කරනු ලබන ස්ථාන 09 ක් වෙනුවෙන් රු.5,000 බැගින් 2018 වර්ෂය සඳහා රු.45,000 ක මුදලක් කර්මාන්ත බදු ලෙස සභාව විසින් අයකරගෙන තිබුණද. ඒ සඳහා පාදක කරගත් පතල් හා කැනීම් ආයතනයෙන් ලබාගත් බලපත්‍රය, මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත් බලපත්‍රය හා අනෙකුත් බලයලත් ආයතනවලින් නිකුත් කරන බලපත්‍ර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. මෙමගින් අවට ප්‍රදේශවාසීන්ගේ ඉඩම්වල ජලය බැසයාමේ ප්‍රශ්ණ ඇතිවීමේ අවදානම පිළිබඳව සභාව විසින් සැලකිලිමත්වී නොතිබුණි. | පාරිසරික ගැටළු පිළිබඳ සභාව සැලකිලිමත් විය යුතුවේ. | මහා නගර සභා ආඥා පනතේ 274 ඇ. (1) යටතේ කටයුතු කර ඇත. |

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය. | 2030 න්‍යාය පත්‍රයට අනුව ක්‍රියාත්මක විය යුතුවේ. | 2019 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සකස් කරන ලද වාර්තාව මේ වන විට සකස් කර ඉදිරිපත් කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාවහන් මිල දී ගැනීම සඳහා වවුචර්පත් ලබා දීම. | | |
| අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාවහන් ලබාදීම සඳහා දරුවන් තෝරාගැනීමට පදනම් කරගත් කරුණු හා නිර්නායකයන් සම්මත කරගෙන නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට රු.2,380,000 ක් වැනි ප්‍රමාණාත්මක වියදමක් දරා පාසල් දරුවන්ට පාවහන් මිල දී ගැනීම සඳහා වවුචර්පත් බෙදාහැරීම සම්බන්ධව හා එම මුදල උපයෝජනය කළ ආකාරය පිළිබඳව විනිවිද භාවයකින් කටයුතු කර නොතිබුණි. | අඩු ආදායම්ලාභීන් තෝරාගත් නිර්නායකයන් ඉදිරිපත් කල යුතු අතර මේ සම්බන්ධයෙන් විනිවිධභාවයකින් කටයුතු කළයුතුවේ. | අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන් සඳහා මෙම වවුචර්පත් ලබා දෙන ලෙස මන්ත්‍රීවරුන් දැනුවත් කර ඇත |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත<br><br>2018 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු 42ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුවලින් 17 ක් බඳවා ගෙන ඇත.<br>මාණ්ඩලික නිලධාරීන් 09න් 02 ක පුරප්පාඩුව පුරවා ඇත.<br>අනෙකුත් මාණ්ඩලික තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.<br>ද්විතීයික තනතුරු පුරප්පාඩුවලින් 06 ක් ම ආදායම් පරීක්ෂක තනතුරු වන අතර, අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතින බැවින්, එම සේවාවෙහි බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත. තාක්ෂණ නිලධාරී (යාන්ත්‍රික) පුරප්පාඩුව 2019. 01. 24 දින පුරවා ඇත. භාෂා පරිවර්තක තනතුර පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. |
| (ආ) සේවක ණය<br><br>සභාවේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 33 දෙනෙකුගෙන් රු.1,713,705 ක් ද, විශ්‍රාම ගිය නිලධාරීන් 46 දෙනෙකුගෙන් රු.377,959ක් ද, සේවය අත්හිට වු නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.125,848 ක් හා සේවය අත්හැර ගිය නිලධාරීන් 37 දෙනෙකුගෙන් රු.410,060 ක ණය ශේෂ අයවිය යුතුව තිබුණි. එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට සභාව කටයුතුකර නොතිබුණි. | කාලය ඉක්මවූ හිඟ සේවක ණය ශේෂයන් අප්‍රමාදව අයකරගත යුතුවේ. | වර්ෂ 10 ක් හෝ ඊට වැඩි කාල සීමාවකදී විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගෙන් අය කර ගත යුතුව පවතින ණය ශේෂය රු. 364,191ක් වේ. සේවය අත්හිටවූ නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.125,848 ක මුදලක් අයවිය යුතුය.සේවය අත් හැර ගිය නිලධාරීන් සේවය අත්හැරගොස් දැනට වසර 03 කටත් වඩා වැඩි බැවින්, එම පිරිසගෙන්ද හිඟ ණය ශේෂ අය කර ගැනීම ගැටළු සහගත විය හැකි ය. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) බත්තරමුල්ල ටී.සී.වත්ත අනවසර පදිංචිකරුවන් වෙත ඉඩම් කට්ටි ලබා දීම. | | |
| රජයට අයත් මෙම ඉඩමෙහි අනවසරයෙන් පදිංචි වී සිටි පදිංචිකරුවන් 13 දෙනෙක් එම ඉඩම්වලින් නෙරපීමට නියෝගයක් 1997 පෙබරවාරි 24 දින කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබා දී තිබුණි. ඒ අනුව ක්‍රියාකරමින් 1997 ජුලි 11 දින පිස්කල් නිලධාරින් විසින් අදාල ඉඩම් කට්ටිවල හිස් නිරවුල් භුක්තිය එවකට කඩුවෙල ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබියදී 2005 මැයි 28 වන දින ඇතිකර ගන්නා ලද බදු ඔප්පු 13 කින් ඉහත කී අනවසර පදිංචිකරුවන් 13 දෙනා වෙත පර්චස් 04 බැගින් වූ ඉඩම් කැබලි 13ක් වසර 33 ක කාලයක් සඳහා මසකට රු.500 ක බදු කුලියකට ලබා දී තිබුණි. වර්තමානයේදී මෙම ඉඩම්වල ඔවුන් නිවාස ඉදිකරගෙන පදිංචිව සිටිති. 2018 දෙසැම්බර් 31 දිනට හිඟ මාසික බදු කුලි රු.101,393 ක් විය. | අධිකරණ නියෝගවලට අනුකූලව සභාව ක්‍රියාකල යුතුවේ. | ගොනුව ආශ්‍රයෙන් කරුණු පරීක්ෂා කර බලා ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ආ) 2016 ජුලි 11 දිනැති අංක LGD/08/2016 දරන බස්නාහිර පලාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු පොදු දේපළ නිවැරදිව මිනුම්කර මායිම් සකස් කර මායිම් පිහිටුවා ගැනීමේ කටයුත්ත සඳහා මිනින්දෝරුවන් 02 දෙනෙකු සමග ගිවිසුම්ගතව ඇතත් මේ වන තෙක්ම එම කාර්යය ඉටු වී නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අප්‍රමාදව කටයුතු කල යුතුවේ. | නැවත මිල ගණන් කැඳවා මිනින්දෝරුවරු කිහිප දෙනෙකුගේ සේවය ලබා ගෙන මෙම කාර්යය කඩිනම් කිරීමට තීරණය කර ඇත. |

3.5 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| ජයවඩනගම ප්‍රජා ශාලාව උත්සව ශාලාවක් බවට පත්කිරීම. | | |
| ජයවඩනගම නිවාස සංකීර්ණයේ ප්‍රජා ශාලාව 2018 නොවැම්බර් මස 07 දින මසකට රු.70,000 ක් බැගින් වර්ෂ 05 ක් සඳහා කුලියට දී තිබුණි. බදු ගිවිසුමේ 13 වන වගන්තියට පටහැනිව සහ සභාවේ එකඟතාවයයෙන් තොරව ගොඩනැගිල්ලේ ස්වභාවය හා ආකෘතිය වෙනස් කර උත්සව ශාලාවක් බවට පත්කර තිබුණි. | නිවාස සංකීර්ණයේ නිවැසියන්ගේ සුභසාධනයට ප්‍රමුඛත්වය ලබා දීම සභාවේ වගකීමකි. | ජයවඩනගම ප්‍රජාශාලාව වෙනස්කර උත්සව ශාලාවක් බවට පත්කර ව්‍යාපාරය පවත්වා ගෙන යාමට බදුකරු විසින් කරන ලද ඉල්ලීම සහ ඒ අනුව, ලබාදුන් අවසරයද මේ සමඟ අමුණා ඇත. ජයවඩනගම ප්‍රජා ශාලාව බදු දීම සම්බන්ධයෙන් ඇති කර ගත්තා වූ ගිවිසුම අනුව නිවාස |

| | |
|---|---|
| ප්‍රජා ශාලාව ව්‍යාපාරික කටයුත්තක් සඳහා ලබා දීම මහා නගර සහා ආඥා පනතේ 4 වන වගන්තියෙහි සඳහන් කර්තව්‍යයන්ට අනුකූල නොවන අතර මේ හේතුවෙන් නිවාස සංකීර්ණයේ නිවැසියන්ට ඔවුන්ගේ පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමට එම ස්ථානය අහිමිව තිබුණි. | සංකීර්ණයේ පදිංචිකරුවන් සඳහා 10% ක වට්ටමක් සහිතව සේවාව සැපයීම කළ යුතු බව සඳහන් කර ඇත. |

3.6 වත්කම් කළමනාකරණය

3.6.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) 1994 වර්ෂයේදී මාලඹේ කහන්තොට පාරේ අංක 130/13 දරන හොරගහවත්ත (ෆැන්ටසි ලැන්ඩ්) උද්‍යානයේදී පවත්වන ලද ඉඩම් වෙන්දේසියේදී පොදු පහසුකම් සඳහා සභාවට පවරා දී තිබුණු පර්චස් 45.47 ක් වූ බිම් කැබැල්ලේ සීමා මායිම් සලකුණුකර නැති අතර, ඔප්පුව අස්ථානගතවී තිබුණි. තවද එම බිම් කැබැල්ල අනවසර පුද්ගලයකු අත්පත් කරගෙන, නිවසක් සාදා පදිංචි වී සිටී. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුවේ. | අනවසරයෙන් පදිංචිව සිටින අයට දින 14 ක් තුළ ඉවත් වන ලෙස 2019. 04. 04 දිනැතිව ලිපියක් යවා ඇත. නමුත්, මෙම පදිංචිකරුවන් ඉවත් වී නොමැති බැවින්, එම පදිංචිකරුවන් ඉවත් කිරීමට නීති උපදෙස් සඳහා 2019. 05. 28 දින අදාළ ගොනුව නීති අංශයට යොමු කර ඇත. |
| (ආ) අතුරුගිරිය සැලසුම් අංක 92/82 දරන "STM ස්ටැල්මේජ් නිවාස" පොදු පහසුකම් ඉඩම් කොටස් 3න් ඉඩම් කොටස් දෙකක අනවසරයෙන් ස්ථිර නිවාස 11ක් පමණ ඉදිකර පදිංචි වී සිටින අතර ඉතිරි කොටස වටකර තාප්පයක් ඉදිකර තිබුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුවේ. | පරීක්ෂා කර ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඇ) දැඩිගමුව, බදුවත්ත වෙන්දේසි ඉඩමේ පොදු පහසුකම් ඉඩම අනවසරයෙන් අත්පත් කරගෙන නිවාස 15 කට පමණ වැඩි ප්‍රමාණයක් ඉදිකර පදිංචිව සිටී. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුවේ. | පරීක්ෂා කර ඉදිරියේ දී පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඈ) මාළඹේ පිට්ටුගල, කහන්තොට ජයන්ති මාවතේ "ටුවින් ටෙරස්" නිවාස ක්‍රමයේ පොදු පහසුකම් ඉඩම් අනවසර පුද්ගලයන් විසින් අත්පත් කරගෙන තිබුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතු වේ. | මෙම ඉඩමේ පිඹුරපත ලැබුණු පසු පොදු පහසුකම් ඉඩම වටා වැටක් සකස් කිරීම සිදු කරනු ඇත. |

3.6.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| කඩුවෙල සතිපොළ පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 සැප්තැම්බර් 09 වන දින මෙම සතිපොළ ජනතා අයිතියට පවරා දී ඇතත්, 2019 මැයි 24 දිනවන තෙක් ඒ සඳහා ස්ථිර විදුලි සම්බන්ධතාවයක් ලබා ගෙන නොතිබුණු අතර වෙළඳසැල් 20 ක් වෙළඳාම් කිරීම සඳහා භාර දී නොතිබුණි. | සතිපොල පවරා ගැනීමේ කටයුතු කඩිනමින් කලයුතු වේ. සියළු වෙළඳසැල් වෙළඳාම් කිරීම සඳහා පවරා දියයුතුවේ. | මේ පිළිබඳව කටයුතු කඩිනමින් ඉටුකිරීමට කමිටුවක් පත්කරන ලදි. වෙළඳ ස්ථාන 20 න් 14 ක් සඳහා මේ වන විටත් ඉල්ලීම් ලැබී ඇති අතර තෙවන අදියර යටතේ ඒ සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කෙරෙමින් පවතී. ඉතිරි වෙළෙඳ ස්ථාන 06 ප්‍රදේශවාසී වෙළෙඳ ප්‍රජාව වෙත ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී. |

3.6.3 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) 2013 වර්ෂයේ කඩුවෙල බස් නැවතුම් පොළෙහි සවිකරන ලද රු.3,900,000 ක් වටිනා විදුලි සෝපානය වර්ෂ ගණනාවක සිටම අක්‍රීය තත්ත්වයේ පවතින අතර එය අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතුකර නොතිබුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | වෙනත් නියෝජිත ආයතනයකින් හෝ කිහිපයකින් පරීක්ෂා කරන ලෙස ඉල්ලීම් කරමින් නැවත ක්‍රියාත්මක කල හැකි තත්ත්වයකට සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ) සභා බලප්‍රදේශයේ මාර්ගවල කාපට් ඇතිරීම සඳහා 2017 ඔක්තෝබර් 20 වන දින රු.66,612,046ක වියදමක් දරා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ඒකක 06 ක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතුරුගිරිය උපකාර්යාල පරිශ්‍රයේ තබා තිබුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | මිලදී ගත් පෙර මිශ්‍රණ ඇතිරීමේ යන්ත්‍ර 06 න් 02 ක් සභාවේ කාර්යයන් සඳහා යොදවා ඇති අතර, ඉතිරි යන්ත්‍ර 04 විකිණීම සඳහා මිල ගණන් කැඳවූවද, ලැබී තිබුණු වැඩිම ලංසු වටිනාකම මෙම යන්ත්‍ර මිලදී ගැනීමට වැයවූ මුදලට වඩා අඩු අගයක් වූ බැවින්, එම මිල ගණන් ප්‍රතික්ෂේප විය. නැවත මිල ගණන් කැඳවීමක් මත විකිණීම හෝ උපයෝජනයට ගැනීම සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම සඳහා කොළඹ මහා නගර සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයට යොමුකර ඇත. |
| (ඇ) සභා බලප්‍රදේශයේ මාර්ගවල සවි කිරීම වෙනුවෙන් මිලදී ගත් වටිනාකම රු.588,050 ක් වූ නාම පුවරු 189 ක් සභා භූමිය තුල අනාරක්ෂිතව ගොඩගසා තිබුණි. | නාම පුවරු ස්ථාපිත කළ යුතුවේ. | මෙම නාම පුවරු ඉදිරියේ දී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ)තල්දියාවල තරුණ මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන කාය වර්ධන මධ්‍යස්ථානය තුල සභාව විසින් මිලදී ගනු ලැබූ වටිනාකම සොයාගත නොහැකි කාය වර්ධන | කාය වර්ධන මධ්‍යස්ථානය නැවත සක්‍රීය කිරීමට කටයුතු | කාය වර්ධන උපකරණ ලබා දී තිබුණ ද ඇතැම් උපකරණ සඳහා සමහර අමතර කොටස් අඩුවෙන් ලබා දී ඇත. නැවතත් මෙම කාය වර්ධන මධ්‍යස්ථානය සක්‍රීය කිරීම සඳහා |

| | | |
|---|---|---|
| උපකරණ, නඩත්තු කිරීමකින් හෝ භාවිතයකින් තොරව තබා තිබුණි. | කළයුතුවේ. | අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමි. |

3.7 හදුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| කඩුවෙල උපකාර්යාලයේ ගබඩා ඒකකයේ තිබූ වටිනාකම රු.343,016 ක් වූ කොඩිකණු 347 ක් අස්ථානගත වී තිබුණි. | පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන්ගෙන් පාඩුව අයකර ගත යුතුවේ. | 2016 වර්ෂයේ සිට පවතින කොඩි කණු 141ක ඌනතාවය පවතින අතර, ඒ පිළිබඳව පරීක්ෂා කරන ලෙස එම සේවක මහතා දැනුවත් කර ඇත. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඊ) පරිදි කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කල යුතුවේ. | ගිණුම් කාරක සභාව ඉදිරියේ කරුණු පැහැදිලි කිරීම සඳහා කැඳවීමට නියමිත බව දන්වා තිබූ බැවින්, ඒ සඳහා පිළිතුරු සකස් කිරීමේ කටයුතු සිදු කළ යුතු විය.<br><br>අභ්‍යන්තර විගණන අංශයේ සේවය කරන ලද සංවර්ධන නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරිනියක් දරු ප්‍රසූතියකින් පසු සේවයෙන් ඉවත් වී ගිය අතර, එක් නිලධාරිනියක් ගුරු පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත් විය. |